සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

## භූගෝල විද්‍යාව

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### 1 කොටස

<u>සැළකිය යුතුයි.</u>

**1 කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න. 11 කොටසට වෙනම කොලයක පිළිතුරු සපයන්න. 11 කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 4 ට පිළිතුරු සැපයිය යුතුය.**

➢ අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01) පාසලේ පිහිටීමේ පරිපාලන ධූරාවලිය තුළ විශාලම පරිපාලන ඒකකය ........................ යි.
(දිස්ත්‍රික්කය, පළාත, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය)

02) ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් තුළ ........................ කීපයක් තිබිය හැකිය.
(දිස්ත්‍රික්ක, පළාත්, ගම්)

03) නැගෙනහිර පළාතට දිස්ත්‍රික්ක ...................... ක් අයත්ය.
(5, 3, 2)

04) ........................ ශ්‍රී ලංකාවේ කුඩාම දිස්ත්‍රික්කයයි.
(යාපනය, ගාල්ල, කොළඹ)

05) යම්කිසි ස්ථානයක කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවතින ස්වභාවය ...................... ලෙස හැදින්වේ. (උෂ්ණත්වය, කාලගුණය, දේශගුණය)

➢ ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් ✓ ලකුණද වැරදි නම් × ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06) සුළං දිශා දර්ශකය දිශාව සෙවීමට යොදා ගනී. (....)
07) ගංගා, ඇළ, දොළ, ජලාශ හා මුහුදු ආශ්‍රිතව සිසිල් සුළඟේ පහස විදිය හැකිය. (....)
08) කාලගුණික තොරතුරු දැන ගැනීමෙන් අනතුරු වළක්වාගත හැකිය.. (....)
09) ත්‍රිමාන ලක්ෂණ නිරූපනය කිරීම සිතියමක් චිත්‍රයකින් වෙනස් වන ලක්ෂණයකි (....)
10) සංචාරක පක්ෂියෙකුට උදාහරණයක් ලෙස අව්ච්චියා හැදින්වීමට පුළුවන. (....)

➢ ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.

11) ශාකයකින් ලැබෙන ප්‍රයෝජනයක් ලෙස සැළකිය නොහැකි වරණය තෝරන්න.

1. පාංශු ඛාදනය වැළැක්වීම. 2. සතුන්ට වාසස්ථාන ලබාදීම.
3. පරාගනයට දායක වීම. 4. ජෛව ඉන්දන ලබාදීම.

12) පහත සතුන් අතරින් අපට අහිතකර සත්වයා කවරෙක්ද?

1. බල්ලා 2. කබරයා 3. කපුටා 4. මීයා

13) හින්දු භක්තිකයින්ගේ ආගමික සංකේතය ලෙස සැළකෙන්නේ පහත කවරක්ද?

1. අඩසඳ හා තරුව. 2. ධර්ම චක්‍රය. 3. ඕම් සංකේතය. 4. කුරුසය.

14) ශ්‍රී ලංකාවේ අඩුම ප්‍රතිශතයක් ජීවත් වන ආගමික කණ්ඩායම වනුයේ,

1. කතෝලිකය. 2. හින්දුය. 3. ඉස්ලාමය. 4. බෞද්ධය.

15) වළං කර්මාන්තයේ දී භාවිතා වන වැදගත් උපකරණයක් වනුයේ.

1. මයිනහම 2. සක පෝරුව 3. බුරුමය 4. පින්සල

➢ 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

16) ශ්‍රී ලංකාව අයත් වන්නේ .............................. මහද්වීපයටය.

17) ශ්‍රී ලංකාව හා ඉන්දියාව ................................................. වෙන්වී ඇත..

18) ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ උෂ්ණත්වය වැඩිවී ඇත්තේ .......................... උප මහද්වීපයේ සිට හමා එන වියලි සුළං නිසාය.

19) සුදු රෙදි හොරා ................................ ලෙස සැළකේ.

20) ඩෙංගු, බරවා, මැලේරියාව වැනි රෝග ................................... මගින් බෝවේ.


## II කොටස

01) අ) i. ඉදිරියේ ඇති ආකෘති සිතියමේ A අක්ෂරයෙන් දක්වා ඇති මුහුද කුමක්ද? (2)

ii. B අක්ෂරයෙන් දක්වා ඇති බොක්ක කුමක්ද? (2)

iii. C අක්ෂරයන් දක්වා ඇති සාගරය කුමක්ද? (2)

iv. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ඇද ඇති රේඛාවෙන් දැක්වෙන සමුද්‍ර සන්ධිය කුමක්ද? (2)




ආ) i. ශ්‍රී ලංකාවේ පිහිටීම දේශගුණයට බලපා ඇති බවට උදාහරණයක් දක්වන්න. (2)

ii. ශ්‍රී ලංකාවේ පිහිටීම ආර්ථිකයට බලපා ඇති බවට උදාහරණයක් දක්වන්න. (2)

iii. ශ්‍රී ලංකාවේ පිහිටීම සංස්කෘතියට බලපා ඇති බවට උදාහරණයක් දක්වන්න. (2)

iv. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම දක්වන්න. (2)

02) i. කාලගුණික උපකරණ සම්බන්ධයෙන් පහත දැක්වෙන වගුවේ අක්ෂර වලට අදාල පිළිතුරු ලියන්න. (4)

| කාලගුණික අංගය | උපකරණය | ඒකකය |
|---|---|---|
| උෂ්ණත්වය | A. | සෙල්සියස් අංශක |
| B. | අනිල මානය | C. |
| පීඩනය | D. | මිලිබාර් |

ii. කාලගුණික තොරතුරු වැදගත්වන වෘත්තීන් දෙකක් දක්වන්න. (2)

iii. ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පිහිටා ඇත්තේ කොහේද? (2)


iv. වර්ෂයක් තුළ ඔබට අත්දැකීමට හැකි විවිධ කාලගුණ තත්ත්වයන් තුනක් දක්වන්න. (3)

03) i. කටු සිතියමක් හා චිත්‍රයක් අතර වෙනස්කම් 3 ක් දක්වන්න. ? (6)

ii. ඔබ පාසල අවට වටපිටාවේ දැකිය හැකි භූ ලක්ෂණ ලැයිස්තුවක් සකස් කරන්න. (2)

iii. සිතියමකින් ඇති ප්‍රයෝජන 3ක් දක්වන්න. (3)

04) i. ඔබ පාසලට අදාල පරිපාලන කොට්ඨාස ධූරාවලිය පහත අංක ඇසුරින් දක්වන්න. (5)




ii. අංක 3,4, යන පරිපාලන කොට්ඨාසයට අදාල රජයේ ප්‍රධාන නිලධාරීන් කවුරුන්ද? (2)

iii. වැඩිම දිස්ත්‍රික්ක ප්‍රමාණයක් හිමි පළාත කුමක්ද? (2)

iv. එම පළාතට අයත් දිස්ත්‍රික්ක 4 ක් දක්වන්න? (2)

05) i. උතුරු දිශාව සොයා ගැනීමට භාවිතා කරන උපකරණය කුමක්ද? (3)

ii. ප්‍රධාන දිශා 4 හා අනු දිශා 4 වෙන වෙනම ලියන්න. (4)

iii. දිශාවෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් දක්වන්න. (2)

iv. ශ්‍රී ලංකාවේ පහත නගර පිහිටි දිශාවන් ඒ ඒ නගර සමඟ දක්වන්න. (2)

* මඩකලපුව * යාපනය * කොළඹ * ගාල්ල

06) i. ඔබ පාසලේ පිහිටීමට අනුව ප්‍රධාන දිශා 4 න් පිහිටි විවිධ ස්ථාන දක්වන්න. (4)

ii. දිශාව භාවිතයෙන් හඳුනාගනු ලබන කාලගුණික අංගය හා උපකරණය දක්වන්න? (2)

iii. දිශාව අවශ්‍ය වන ප්‍රවාහන මාධ්‍ය දෙකක් ලියන්න. (2)

iv. දිශාව සොයා ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාකාරකමක් විස්තර කරන්න. (3)

07) i. පහත ශාක අතරින් ඖෂධීය ශාක දෙකක් වෙන් කර දක්වන්න. (2)

(අරළු, පොල්, කළුවර, වැටමාර, නෙල්ලි, වීර, පලු, මැහෝගනී, රබර්, ඇට්ටේරියා)

ii. ශාකයකින් ඇති ප්‍රයෝජන ලැයිස්තුවක් සකස් කරන්න. (3)

iii. අපට අහිතකර සතුන් හා හිතකර සතුන් පහත ලැයිස්තුවෙන් වෙන්කර දක්වන්න. (3)

(මීයා, ගැඩවිලා, වව්ලා, වේයා, මදුරුවා, ගොලු බෙල්ලා, ඇටි කුකුලා, මීමැස්සා, සමනලයා)

iv. ඉහත හිතකර සතුන්ගෙන් ඇති ප්‍රයෝජනය බැගින් දක්වන්න. (3)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 06 - 2024

## භූගෝල විද්‍යාව - පිළිතුරු පත්‍රය

නම / විභාග අංකය:

### 1 කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01) පළාත | 02) ගම | 03) 3 | 04) කොළඹ | 05) කාලගුණය |
| 06) × | 07) ✓ | 08) ✓ | 09) ✓ | 10) ✓ |
| 11) 3 | 12) මීයා | 13) 3 | 14) 1 | 15) 2 |
| 16) ආසියා | 17) පෝක් සමුද්‍ර සන්ධිය | 18) ඉන්දීය | 19) සංචාරක පක්ෂියෙකු | 20) මදුරුවන් |

### 11 කොටස

01) අ) i. A- අරාබි මුහුද ii. B - බෙංගාල බොක්ක iii. C - ඉන්දියන් සාගරය iv. - පෝක් සමුද්‍ර සන්ධිය

ආ) i. මෝසම් වර්ෂාව ඇතිවීම, දිවයිනේ උතුරුට උෂ්ණත්වය වැඩිවීම, වසර පුරා වර්ෂාව පවතීම වැනි පිළිතුරක්....

ii. පෙර අපර දෙදිග නාවික කේන්ද්‍රස්ථානයක් වීම, සංචාරක කේන්ද්‍රස්ථානයක් වීම, බටහිර ආතීන් පැමණීම නිසා නව ආර්ථික ක්‍රමයක් බිහිවීම වැනි පිළිතුරක් ....

iii. විවිධ ජන වර්ග පැමිණීම නිසා විවිධ ආගම්, භාෂා ඇතිවීම, විවිධ සංස්කෘතිකාංග ඇතිවීම වැනි පිළිතුරක් ...

iv. ආසියා මහද්වීපයට දකුණින්ද, ඉන්දියන් සාගරයට උතුරින්ද, ගිණිකොණ ආසියාවට බටහිරින්ද, අප්‍රිකා මහද්වීපයට නැගෙනහිරින්ද ශ්‍රී ලංකාව පිහිටා ඇත.

02) i. A - උෂ්ණත්වමානය B - සුළගේ වේගය C - පැයට කිලෝමීටර් D - පීඩන මානය

ii. නැවියා, ගුවන් නියමුවා, ධීවරයා, ගොවියා ආදී වෘත්තීන්

iii. කොළඹ 07, බෞද්ධාලෝක මාවත

iv වැසිබර, උණුසුම්, සුළං සහිත, වියලි, ආදී කාලගුණ තත්ත්වයන්

03) i.

| කටු සිතියම | චිත්‍රය |
|---|---|
| ද්විමාන ලක්ෂණ දක්වයි | ද්විමාන ලක්ෂණ දක්වයි |
| සංකේත වර්ණ භාවිතා කරයි | ස්වභාවික පෙනුම නිරූපනය කරයි |
| පරිමාණයක් සහිතයි | පරිමාණයක් නැත |
| පර්යාවලෝකනය නොදක්වයි | පර්යාවලෝකනය දක්වයි ආදී පිළිතුරු |

ii. උස්බිම්, පහත්බිම්, ගොඩනැගිලි, මාර්ග, උද්‍යාන, ඇල දොල, වගාබිම්, වනාන්තර ආදී භූ ලක්ෂණ

iii. මාර්ග, ජලාශ, ආදිය සැළසුම් කිරීමේ දී, ස්ථාන සොයා ගැනීමේ දී, මාර්ග සොයා ගැනීමේ දී ආදී පිළිතුරු

04) i. 1 - පාසල අයත් පළාත 2 - පාසල අයත් දිස්ත්‍රික්කය 3. පාසල අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය 4. පාසල අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාසය 5 - පාසලේ නම

ii. 3 - ප්‍රාදේශීය ලේකම් 4 - ග්‍රාම නිලධාරී iii. උතුරු පළාත iv. යාපනය, කිලිනොච්චි, වව්නියා, මුලතිව්, මන්නාරම

05) i. මාලිමාව ii. ප්‍රධාන දිශා - උතුරු, දකුණු, නැගෙනහිර, බටහිර අනුදිශා - ඊසාන, ගිණිනොණ, නිරිත, වයඹ

iii. මාර්ග සොයා ගැනීමට, සිතියම් කියවීමට, කාලගුණ තොරතුරු දැන ගැනීමට ආදී ....

iv. මඩකලපුව - නැගෙනහිර යාපනය - උතුර කොළඹ - බස්නාහිර ගාල්ල - දකුණ

**06)** i. ඔබ පාසලට අනුව ලකුණු ලබා දෙන්න. ii. සුළං දිශාව සුළං දිශා දර්ශකය
iii. ගුවන් ප්‍රවාහනය, නාවික ප්‍රවාහනය iv. නැගෙනහිර දිශාව දෙස බලා සිටගෙන අත් දෙපසට ඔසවා දකුණු අත දකුණු දිශාවටත් වම් අත උතුරු දිශාවටත් ආදී ලෙස සිදුකරන ක්‍රියාකාරකම විස්තර විය යුතුය.

**07)** i. අරළු , නෙල්ලි ii. ප්‍රයෝජන 6 ට ලකුණු 3 ක් ලබා දෙන්න.

iii.

| | |
|---|---|
| හිතකර | ගැඩවිලා, වව්ලා, වේයා, ඇටිකුකුලා, මීමැස්සා, සමනලයා |
| අහිතකර | මීයා, මදුරුවා, ගොලු බෙල්ලා, |

iv. ගැඩවිලා - පස බුරුල් කිරීම , වව්ලා - බීජ ව්‍යාප්ත කිරීම වේයා - කසල දිරාපත් කිරීම, ඇටි කුකුලා - ගොළු බෙල්ලන් කා දැමීම, මීමැස්සා පරාගනය/ මී මැණී නිෂ්පාදනය, සමනලයා - පරාගනය